# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2322/49 - 2023 මාර්තු මස 08 වැනි බදාදා - 2023.03.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### ඡන්ද විමසීම පිළිබඳ දැන්වීම

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)**

38(3) උපවගන්තිය යටතේ වූ නියමය

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38(1)(ඇ) වගන්තිය යටතේ මා විසින් පළ කරන ලද අංක 2317/23 හා 2023.01.30 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සඳහන් කළ පරිදි පහත දක්වා ඇති උපලේඛනයේ සඳහන් පළාත් පාලන ආයතන සඳහා වූ ඡන්ද විමසීම 2023 මාර්තු මස 09 දින නොපැවැත්වෙන බවද,

මැතිවරණ කොමිෂන් සභාවේ පාලනයෙන් පරිබාහිර අනපේක්ෂිත හා නොවැළැක්විය හැකි කරුණු හේතු කොටගෙන එකී ඡන්ද විමසීමේ දිනය කල් දැමීමට සිදු වී ඇති බැව් මැතිවරණ කොමිෂන් සභාව විමසීමෙන් අනතුරුව එකී කොමිෂන් සභාව විසින් මා හට උපදෙස් දී ඇති හෙයින් ද,

එකී පළාත් පාලන ආයතනවලට අදාළ නව ඡන්ද විමසීමේ දිනය වශයෙන් 2023 අප්‍රේල් මස 25 වැනි දිනය මවිසින් මෙයින් නියම කරන බවද,

(262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38(1)(ඇ) උප වගන්තිය සමග කියවිය යුතු එකී ආඥාපනතේ 38(3) උප වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

**දමයන්ති පරණගම,**
තේරීම්භාර නිලධාරි,
බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කය.

2023 මාර්තු මස 08 වැනි දින,
බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී ය.


1A - G 39067— 31 (2023/03)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

බදුල්ල මහා නගර සභාව
බණ්ඩාරවෙල මහා නගර සභාව
හපුතලේ නගර සභාව
මහියංගන ප්‍රාදේශීය සභාව
රිදීමාලියද්ද ප්‍රාදේශීය සභාව
සොරණාතොට ප්‍රාදේශීය සභාව
මීගහකිවුල ප්‍රාදේශීය සභාව
කන්දකැටිය ප්‍රාදේශීය සභාව
පස්සර ප්‍රාදේශීය සභාව
ලුණුගල ප්‍රාදේශීය සභාව
බදුල්ල ප්‍රාදේශීය සභාව
හාලිඇල ප්‍රාදේශීය සභාව
ඌව පරණගම ප්‍රාදේශීය සභාව
වැලිමඩ ප්‍රාදේශීය සභාව
බණ්ඩාරවෙල ප්‍රාදේශීය සභාව
ඇල්ල ප්‍රාදේශීය සභාව
හපුතලේ ප්‍රාදේශීය සභාව
හල්දුම්මුල්ල ප්‍රාදේශීය සභාව

EOG 03- 0107

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.